www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# යුක්රේනයේ ගැටුමට තුඩු දී තිබෙන ජනාධිපතිවරනයට ඇමරිකාව ඇඟිලි ගසයිඃ යකෝ කවුද ඔහේගෙන් ඇහුවෙ, පවල් උන්නැහේ?

**US intervenes in disputed Ukrain election: Who the hell asked you, Mr. Powell?**

**ජෝසප් කේ විසිනි.**

**2004 නොවැම්බර් 30**

පසුගිය සතියේ දී එක්සත් ජනපද රාජ්‍ය ලේකම් කොලින් පවල් යුක්රේනයේ ගැටුමට තුඩු දී තිබෙන ජනාධිපතිවරනය බුෂ් පාලනාධිකාරයේ උසස් ප්‍රමිතීන්ට නො සරිලන හෙයින් පිලිගත නො හැකි යයි කල ප්‍රකාශය, එහි ප්‍රතිගාමී ඇඟවුම් නොවන්නට තද බල හාස්‍යයට ලක් වනු ඇත.

බලවි, හොරා ගත් මැතිවරනයක් මගින් මුලින්ම බලයට පත් පාලනාධිකාරයක ප්‍රධාන ජාත්‍යන්තර කථිකයා වන ඇමරිකානු රාජ්‍ය ලේකම් තැන යුක්රේනයේ ඡන්ද විමසීම ''ජාත්‍යන්තර ප්‍රමිතීන්ට නො සරිලන හෙයින් ද වංචා හා දූෂන පිලිබඳ විවිධ විශ්වසනීය වාර්තාවක් විභාග නො කරන ලද හෙයින් ද යුක්තිජාත නොවන්නේ ය''යි කියා සිටින හැටි.

2000 වර්ෂයේ ඇමරිකානු ජනාධිපතිවරනයේ බුෂ්ට හිමි කරමින් දුන් නඩු තීන්දුව ප්‍රජාතන්ත්‍ර අයිතීන් අමු අමුවේ උල්ලංඝනය කිරීමක් යයි ද එම නිසා ඒ නඩුව මගින් ධවල මන්දිරය බුෂ්ට භාර කිරීම ''ජාත්‍යන්තර ප්‍රමිතීන්ට නො සරිලන්නේ ය''යි ද ''මුලුමනින් ම පිලිගත නොහැකි ය''යි ද රුසියාව, චීනය හෝ යුරෝපීය සංගමයේ රටක් ප්‍රකාශ කලේ නම් එක්සත් ජනපද පාලක කවයන් තුල ඇති විය හැකිව තිබුනු ප්‍රතිචාරය කෙබඳු වනු ඇත් දැයි අපට සිතා ගත හැකි ය. එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ ප්‍රධාන රාජ්‍ය තාන්ත්‍රික නියෝජක තැන ලෙස රාජ්‍ය ලේකම් පවල්ට තමාගේ තත්වය හිමි වී ඇත්තේ එකී අමු තිත්ත මැතිවරන මගඩිය තුලින් ය.

2000 ඇමරිකානු ජනාධිපතිවරනයේ දී කරන ලද ලේඛනගත වංචා හා දූෂනවලට පහත සඳහන් දෑ ඇතුලත් වේ: ෆ්ලොරිඩා රාජ්‍යයේ කම්කරු පන්තික ඡන්ද දායකයන් සංවිධානාත්මක ලෙස බියවැද්දීම, නීත්‍යනුකූල ඡන්ද ප්‍රතිගනනය වැලැක්වීමට රිපබ්ලිකන් පක්ෂය මැදිහත් වීම, ප්‍රාදේශීය ඡන්දාවරන මන්ඩල බියවැද්දීම සඳහා රිපබ්ලිකන් පක්ෂය විසින් මැරයින් මෙහෙයවීම සහ ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ් මහජන ඡන්දයෙන් පැරදුනත් පක්ෂග්‍රාහී ශ්‍රේෂ්ඨාධිකරනයක් විසින් ඔහුට ම ජය අත් කර දීම ෆ්ලොරීඩා ප්‍රාන්ත රාජ්‍යයේ දී ඡන්ද ප්‍රෝඩාව හා බියවැද්දීම සිදු කරන ලද්දේ රිපබ්ලිකානු අපේක්ෂක ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ්ගේ සහෝදර ජෙබ් බුෂ් සහ ඔහුගේ ප්‍රාන්ත රාජ්‍ය ඡන්ද ව්‍යායාමයේ සංවිධායක ලෙස වැඩ කල ෆ්ලොරීඩා රාජ්‍ය ලේකම් කැතරීන් හැරිස් විසිනි.

සමහරවිට 2000 ජනාධිපතිවරනයේ තරමට ම නොවතු ද 2004 වරනයේ දී ද මගඩි සිදු කරන ලද බවට සාක්ෂ්‍ය තිබේ. යුක්රේනයේ ඡන්දවරනයේ දී ප්‍රෝඩා කරන ලදැයි තහවුරු කිරීමට බුෂ් පාලනාධිකාරය විසින් යොදා ගනු ලැබූ ප්‍රධාන සාක්ෂ්‍යයක් නම් වත්මන් අගමැති වික්ටර් යනුකෝවිච්ට ජය ලබා දුන් නිල ඡන්ද ඡන්ද ප්‍රතිඵල සහ ඇමරිකානු-යුරෝපීය සහය ලත් අපේක්ෂක වික්ටර් යුෂ්ටෙන්කෝ සැලකියයුතු වැඩි ඡන්ද සංඛ්‍යාවකින් ජයග්‍රහනය කලේ යයි අඟවන පසු ඡන්ද මත විමසීම් (ඡන්දය දී පිටවන්නන් ගෙන් කරන ලද මත විචාරන) නො සැසඳීම ය. එහෙත් 2004 ඇමරිකානු ජනාධිපති වරනයේ දී මෙම සංඛ්‍යා අතර නො සැසඳුම පැන නැගුනි. නිල ඡන්ද ගනනය අනුව බුෂ් දිනුවද, ඔහු ජය ගත් ප්‍රාන්ත රාජ්‍ය ගනනාවක ඡන්දය දී පිට වී යන්නන් ගෙන් කරන ලද විමසුම්වලින් පෙන්නුම් කෙරෙන්නේ ඩිමොක්‍රැටික් පාක්ෂික ජෝන් කෙරී සැලකියයුතු වැඩි ඡන්ද සංඛ්‍යාවකින් ජයග්‍රහනය කල බව ය.

ඉහත සඳහන් චෝදනා සත්‍යයඃ එහෙත් ඒවා ඊට වඩා බොහෝ බරපතල ලෙස මුලු පද්ධතිය මට්ටමේ ම ඇමරිකා එක්සත් ජනපදයේ මැතිවරනයන් වංචනිකව හසුරුවනු ලැබුවේ ය යන්න සැලකිල්ලට ගන්නේ වත් නැත. මහා කොම්පැනිවල සල්ලි කන්දරාව ජනමාධ්‍ය මගින් මහ ජන මතය වංචනික ලෙස නො මග යැවීම, විරුද්ධවාදී පක්ෂ හා දෘෂ්ටි ආස්ථාන ක්‍රමානුකූලව ඉවත්කර දැමීම, තේරීම් විද්‍යාල ක්‍රමයේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ස්වභාවය යන මේ සියල්ල ඒකාබද්ධ වීම මගින් ඇමරිකානු ජනාධිපතිවරනයේ දී ඉදිරිපත් විය හැකි අපේක්ෂකයන් යෝධ සංගත හා බැංකු කුවේරයන් විසින් තෝරා ගන්නා අය බව සහතික

කරනු ලැබේ.

20වන සියවස පුරාම ඇමරිකාවේ වාර්තාව සලකා බලන කල්හි, යුක්රේනයේ දී ප්‍රජාතන්ත්‍රවාදය සඳහා තමන් පෙනී සිටින බවට බුෂ් පාලනාධිකාරය දක්වන ව්‍යාජයේ කුහක ස්වභාවය වඩාත් හොඳින් පැහැදිලි වේ. දශකයෙන් දශකයට විශේෂයෙන් ම 1947 සීතල යුද්ධය ඇරඹූ තැන් පටන් ඇමරිකා එක්සත් ජනපදය ලෝකය පුරාම ජනතාවගේ ප්‍රජාතන්ත්‍ර අපේක්ෂාවන්ට එරෙහිව ඇමරිකානු මහ කොම්පැනි සහ බැංකුවල උවමනාකම සඳහා ඉතා ක්‍රමානුකූලව කටයුතු කර තිබේ. 1973 දී ප්‍රජාතන්ත්‍රවාදීව තේරී පත් වූ චිලී රටේ ජනාධිපති සැල්වදෝර් අයියන්ඩේ ඝාතනය කිරීමට දුන් ඇමරිකානු සහාය, ඉරාකය, ගුවතමාලාව, ග්‍රීසිය, තුර්කිය, දකුනු කොරියාව, ඉන්දුනීසියාව, පකිස්ථානය, බ්‍රසීලය, ආර්ජන්ටිනාව, බොලිවියාව, උරුගුවේ, ඩොමිනිකානු සමූහාන්ඩුව හා පැනමාව යනාදී වසයෙන් ඡන්දයෙන් තෝරා පත් කර ගනු ලැබූ ආන්ඩු කුමන්ත්‍රනකාරීව පෙරලා දැමීමේ මාලාවක වඩාත් නමගිය සිද්ධිය ය. එක්සත් ජනපද පාලනය අප්‍රිකාවේ, ආසියාවේ, ලතින් ඇමරිකාවේ සහ මැද පෙරදිග ප්‍රජාතන්ත්‍ර විරෝධී පාලන තන්ත්‍රවලට එලිපිටම සහාය දී ඇත. ෆ්‍රැන්කෝගේ ස්පාඤ්ඤය වේවා, වර්නභේදවාදී දකුනු අප්‍රිකාව වේවා, සෞදි අරාබියාවේ මෘග වැඩවසම් රාජාන්ඩුව වේවා, කුමන දක්ෂිනාංශික ඒකාධිපතිත්වයක් වුව මෘග වැඩි යයි ද ලේ පිපාසිත වැඩි යයි ද ඇමරිකානු සහායට නුසුදුසුව නැත.

ඇමරිකාවේ හවුල්කරුවන් ලෙස අත්තනෝමතික මෘග පාලකයන් හා ඒකාධිපතියන් බඳවා ගැනීම සඳහා දැන් බුෂ් ගේ ''ත්‍රස්ත විරෝධී යුද්ධය'' අලුත් පන්නයේ ව්‍යාජයක් සපයයි. මෙම සහකරුවන් අතර ඊජිප්තුවේ හොස්නි මුබාරක්, සහ පකිස්ථානයේ ජෙනරල් මුෂාරෆ් ද උස්බෙකිස්ථානයේ ඒකාධිපතියා වන හිටපු ස්ටැලින්වාදී කැරිකොව් ද ඇතුලත් ය.

පසුගිය වර්ෂයේ දී තෙල්වලින් පෝසත් අසර්බයිජානයේ හිටපු ස්ටැලින්වාදියෙකු වූ ජනාධිපති හයිදර් අලියෙව් කයෝර ලෙස ප්‍රෝඩා කරන ලද ඡන්ද විමසීමක් මගින් තම පුත්‍රයා ජනාධිපති පදවියට පත් කරමින් සිදු කල රජකම පැවරීමක් වැනි ක්‍රියාවට බුෂ් පරිපාලනයේ සුබ පැතුම් ලද්දේ ය. වඩාත් මෑත දී ඇමරිකානු පුවත් මාධ්‍ය විසින් එක්සත් ජනපද ආධාර ලත් හමිඩ් කර්සායි ලත් මහා ප්‍රජාතන්ත්‍රවාදී ජයග්‍රහනයක් ලෙස වාර්තා කරනු ලැබූ ඇෆ්ඝනිස්ථානයේ ඡන්ද විමසීම බලහත්කාරය යොදා ඇමරිකානු හමුදාවේ අනුග්‍රහය ඇතිව තුවක්කු මානාගෙන කරන ලද්දක් බව ලොව පුරා පිලිගනු ලැබ ඇත.

හෙට අනිද්දා ඉරාකයේ පැවැත් වීමට නියමිත මැතිවරනයේ දී එක්සත් ජනපද ආන්ඩුව ප්‍රෝඩාවෙන් හා දූෂනයෙන් සැහීමට පත් වන්නේ නැත. ඇමරිකානු පාලනය ඉරාකය තුල දේශපාලන සමූලඝාතනයේ කාලාන්තරයක් පුරුදු විධික්‍රමයන්හි යෙදී සිටින්නේ - ඉරාක ප්‍රතිරෝධයේ සටන්කරුවන්ගේ ලෙයින් ජනවාරි මැතිවරනයේ භූමිය පොහොර කරමිනි. මේ ලඟ ගතවූ සතියේ දී ඉයාද් අලාවිගේ රූකඩ පාලනයේ විරුද්ධවාදීන් දෙදෙනෙක් උතුරේ මොසුල් නුවර දී මරා දමනු ලැබූහ. පසුගිය වර්ෂයේ ආක්‍රමනයෙන් පසු 100,000ක් ඉරාක ජාතිකයෝ මරා දමනු ලැබූහ. පසුගිය මස තුල ෆලූජා නගරය සමූලඝාතනයේ දී තවත් දහස් ගනනක් මරා දමනු ලැබූහ.

ඉරාකය ආක්‍රමනය කිරීමට ආධාර කිරීම මගින් පවල් ද කුප්‍රකටයෙකු බවට පත්ව සිටී. ''යුක්රේනයේ මැතිවරන ප්‍රෝඩා හා දූෂන'' හෙලා දැකීම කරනු ලැබ ඇත්තේ-තමාගේ අවංක බව පිලිබඳ කිසියම් විශ්වාස මාත්‍රයක් හෝ කවරකු තුල වත් ඉතුරු නො කර සිටින්නා වූ තම රාජ්‍ය ලේකම් ධුර වාරය තුල අහෝසි කර ගෙන සිටින්නා වූ තැනැත්තෙකි. මේ මිනිහා දස ලක්ෂ ගනන් මිනිසුන්ගේ ඇස් ඉදිරියේ, ඉරාකයේ තිබුනේ යයි කියන ලද මහා විනාශකාරී අවි පිලිබඳව විවෘතව හා නිර්ලජ්ජිතව බොරු කියා හසු වී සිටී.

ඇමරිකානු ආස්ථානයේ කුහක බව වටහා ගැනීමට යුක්රේනියානු මැතිවරනය ප්‍රජාතන්ත්‍ර පටිපාටියේ පරම ආදර්ශයක් වී යයි තර්ක කිරීම හෝ රුසියානු ආධාර ලත් අපේක්ෂක යනුකෝවිච්ට සහාය දැක්වීම හෝ අවශ්‍ය නො වේ. යුක්රේන ඡන්ද විමසීමේ දී සැලකියයුතු මට්ටමක වංචාවක් සිදු කරන ලදැයි යන්න සෑහෙන තරම් සහතික බවකින් යුතුව කිව හැකි බව සත්‍යය ය. එවැනි දේ දෙපැත්තෙන් ම සිදු වන්නට ඇත. යනුකෝවිච් ජයග්‍රාහකයා යයි ප්‍රකාශ කරවීමට රුසියානු ජනාධිපති ව්ලැඩිමීර් පුටින් බෙහෙවින් බලපාන්නට ඇතැයි යන්න ද නිසැක ය. එසේම එක්සත් ජනපදය ද යුරෝපීය සංගමය ද යුෂ්චෙන්කෝට සහාය දීම සඳහා විශාල මූල්‍ය හා දේශපාලන ආධාර සපයන්නට ඇත. එක් අතකට රුසියාව ද අනෙක් අතට ඇමරිකා එක්සත් ජනපදය සහ යුරෝපය ද අතර ඇතිව පවත්නා යුක්රේනය පිලිබඳ සට්ටනය කිසි සේත් ම අධිකාරවාදයට එරෙහි ප්‍රජාතන්ත්‍රවාදය පිලිබඳ ප්‍රශ්නයක් නො වේ. මෙහි ලා අදාල වන්නේ පොහොසත් කෘෂිකාර්මික හා කාර්මික ප්‍රදේශයක් වසයෙන් ද වැදගත් ගෑස් පොම්ප පද්ධතියක් තුල කේන්ද්‍රීය ස්ථානයක් වසයෙන් ද රුසියාව, නැගෙනහිර යුරෝපය, කෝකේසස් ප්‍රදේශය සහ කලු මුහුද අවට ප්‍රදේශයට මායිම්වූ රටක් වසයෙන් ද යුක්රේනයේ තීරනාත්මක භාවය නිසා ඇති වී තිබෙන එකිනෙකට ප්‍රතිවිරුද්ධ අවශ්‍යතා අතර සට්ටනයකි.

මෙම ප්‍රදේශය තුල ඇමරිකානු උත්සුකතාව පවත්නේ ඇෆ්ඝනිස්ථානයේ හා ඉරාකයේ යුද්ධ තුලින් ද ප්‍රකාශිතව පවත්නා එම ගෝලීය මූලෝපාය නිසාම ය. සෝවියට් සංගමයේ බිඳ වැටීමට ඇමරිකානු ප්‍රතිචාරය වී ඇත්තේ ඇමරිකානු පාලක ප්‍රභූව තම බලපෑම තෙල් වලින් පොහොසත් මැදපෙරදිග පමනක්

නොව, රුසියාවේ අනුහස් වැයික්කිය ලෙස දිගු කලක් තිස්සේ ඉබේටම පිලිගැනී තිබුනු පැරනි සෝවියට් සංගමයට අයත්ව තිබූ මධ්‍යම ආසියාවේ සහ කොකේසස් ප්‍රදේශයේ ද නැගෙනහිර යුක්රේනයේ ද තම අනසක පතුරවා ගැනීමට ඇමරිකානු පාලක ප්‍රභූවට පවත්නා සූදානම ලෙසට ය.

ඇමරිකානු නිලධාරින්ද මාධ්‍ය ද නැගෙනහිර යුරෝපය තුල රුසියානු ''නව-අධිරාජ්‍යවාදය'' ඇඩිසේ හෙලා දකින අතර මෙම ප්‍රදේශය තුල ඇමරිකානු මැදිහත් වීම පිලිබඳ කිසිවක් සඳහන් නො කරති. ඇමරිකා එක්සත් ජනපදය විසින් ඇෆ්ඝනිස්ථානය තුලට කරන ලද ආක්‍රමනයට පසුව මෙම ප්‍රදේශය තුල පැරනි සෝවියට් සංගමයට අයත්ව තිබූනු මධ්‍යම ආසියානු රටවල් ගනනාවක ස්ථිර හමුදා කඳවුරු පිහිටුවා ගත්තේ ය. පසුගිය අවුරුද්දේ ඇමරිකාව ජෝර්ජියාව තුල ඇමරිකානු හිතවාදී මිකායල් සකාශ්විලිගේ ආන්ඩුව බලයට පත් කල ඊනියා ''රෝස විප්ලවය'' අවුලුවා ලීය. ඉන් ඉක්බිති සකාශ්විලි ගෙන ගිය දක්ෂිනාංශික ආර්ථික පිලිවෙත ජනගහනයේ පලල් කොටසකට විනාශය ලඟා කලේ ය. යුෂ්චෙන්කෝ යටතේ යුක්රේනය තුල ද නිසැකවම එවන් පිලිවෙත් ම ක්‍රියාත්මක කෙරෙනු ඇත. බටහිර සංගත හා ප්‍රාග්ධනයට දොර හැර දෙනු ඇත.

*ලෝක සමාජවාදී වෙබ් අඩවිය* සරල අභ්‍යාසයක යෙදී ගන්නා ලෙස සිය පාඨකයන්ට කියා සිටී. ගූගල්ස් සෙවිලි යතුර කරා එලඹ ''එක්සත් ජනපද-යුක්රේන සම්බන්ධතා'' සොයා යන්න. මීට වඩා සිත් ගන්නා ලෙස එයට ''තෙල්'' සහ ''ගෑස්'' යන වචන එකතු කර බලන්න. එක්සත් ජනපදය මෙම ප්‍රදේශ තුල මෑත වසරවල දී පෙන්නා තිබෙන උනන්දුව පිලිබඳ තොරතුරු දාම ඔබ වෙත ගලා එනු ඇත.

ජිමී කාටර් යටතේ ආරක්ෂක ලේකම් ලෙස සිටි ස්බිග්නියු බ්‍රෙෂින්ස්කි යුක්රේනය පිලිබඳ විශේෂ උනන්දුවක් දක්වා ඇත. ඔහු මේ වසරේ මැයි මස යුක්රේනයට ගියේ ද වේ. රුසියාවට පාඩුවන ආකාරයෙන් යුක්රේන-ඇමරිකා සම්බන්ධතා වර්ධනය කල යුතු යයි ඔහු කියා සිටියේ ය.

1994 දී ඔහු ලියූ මහා ''දාම් පෙත'' (චෙස් බෝඩ්) නම් ඔහුගේ කෘතියේ පිලිවෙත සමග මෙම ගමන ගැලැපුනි.

යුරේසියා ප්‍රදේශය තුල තීරනාත්මක කේන්ද්‍රස්ථාන පහෙන් එකක් යුක්රේනය බව ඔහු කියා සිටින්නේ ය. මේවා පාලනය කිරීම ලෝකය පාලනය කිරීම සඳහා තීරනාත්මක යයි ද ඔහු කියයි. රුසියාවේ බලයට වල කැපීමට නම් යුක්රේනය බටහිරට හිතවත් ''ස්වාධීන'' රටක් ලෙස පවත්වා ගැනීමේ වැදගත්කම හෙතෙම පෙන්වා දුන්නේ ය.

මෙසේද ලිවී යඃ ''යුක්රේනය නැති කල්හි රුසියාව යුරේසියානු බලවතෙකු ලෙස තවත් ඉතුරු නො වනු ඇත. බ්‍රෙෂින්ස්කි යුක්රේනයට ගියේ නියෝජ්‍ය රාජ්‍ය ලේකම් ආර්මිටේජ් එහි යාමට මදකට පසුව ය. විපක්ෂ නායක යුෂ්චෙන්කෝව මුනගැසුනු ආර්මිටේජ් පුවත්පත් සාකච්ඡාවක් පවත්වා යුක්රේනය නැටෝ සංවිධානයට ද ලෝක වෙලඳ සංවිධානයට ද එක්විය යුතු යයි කියා සිටියේ ය. යුක්රේනයේ ජනපතිවරනයේ යුක්තිජාත බව ගැන සැක ප්‍රශ්න මතු කල වුන් අතර ආර්මිටේජ් ඉන් පසුව මුල් තැනක් ගති. ආර්මිටේජ්ගේ ප්‍රධානියාවන කොලින් පවල් එක්සත් ජනපදය යුක්රේන ඡන්ද විමසීමේ වලංගු බව පිලිනොගන්නා බව ප්‍රකාශ කලේ ය.

උද්ධච්ච මෘග භාවය නිසා ලෝකයේ ජනයාගෙන් වැඩිදෙනකු ගේ පිලිකුලට යුක්තිසහගතව ම එල්ලව සිටින පොදුවේ ඇමරිකානු ආන්ඩුවත් විශේෂයෙන් ම බුෂ් පාලනාධිකාරයත් යුක්රේනයේ හෝ වෙනත් තැනක මැතිවරන පිලිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය තමන් වෙතට පවරා ගෙන ඇත්තේ මොන යුක්ති සහගත හේතුවක් නිසා ද?

ඉරාකයේ දී මෙන් ම යුක්රේනයේ දී ත් ඇමරිකානු පිලිවෙත සමග උද්ධච්ච ආක්‍රමන කාරිත්වය සහ ඉව බව නැතිකම බැඳී පවතී. යුෂ්චෙන්කෝ කඳවුරට අනම්‍ය පිලිවෙතක් අනුගමනය කිරීමට දිරි දීම මගින් ද ඩොන්බාස් ප්‍රදේශය ද නැගෙනහිර යුක්රේනයේ රුසියන් කථා කරන වැඩි කොටසකින් සමන්විත වූ කම්කරු පන්තියේ යුක්තිජාත සමාජ හා දේශපාලන උත්සුකතාවන් උල්ලංඝනය කර කුප්පා ලීම මගින් ද බුෂ් පාලනාධිකාරය සිවිල් යුද්ධය හා එ රට බෙදීමේ සැලැස්මක් ක්‍රියාත්මක කරමින් සිටී. මෙය යුගෝස්ලේවියානු ආකෘතියට සමාන, එහෙත් රුසියාවේ දේශ සීමාව අද්දර පවත්නා වූද යුගෝස්ලාවියාවට වඩා දෙගුනයක් විශාල වූද පැරනි සෝවියට් සංගමයේ ආයුධ ගබඩාවේ විශාල කොටසකට අත ගසා ගත හැකි වූද රටකි.

© www.wsws.org